MINISTERO DELL'INTERNO

euaa EUROPEAN UNION AGENCY FOR ASYLUM

# පිළිගැනීම තුළ ඔබේ අයිතීන් සහ වගකීම්



**මෙම තොරතුරු ඔබ සඳහායි:**

- ඔබට වයස අවුරුදු 18 ට අඩු  නම්
- ඔබ පැමිණියේ ඔබේ දෙමව්පියන්ගෙන් එක් අයෙකු හෝ දෙදෙනාම සමඟ නම්
- ඉතාලිය හි රැකවරණය (ජාත්‍යන්තර ආරක්ෂාව ලෙසද හැඳින්වේ) සඳහා ඔබ සහ ඔබේ පවුලේ අය ඉල්ලුම් කර ඇත්නම්

ලියාපදිංචිය සඳහා වන අනුවාදය

SINHALESE


# පටුන


| | |
|---|---|
| ඔබ සහ ඔබේ පවුල මෙම රට තුළ ආරක්ෂිතයි | 3 |
| ඔබට උපකාර කළ හැක්කේ කාටද? | 3 |
| ඔබට සහ ඔබේ පවුලේ අයට ලැබෙන්නේ මොනවාද? | 4 |
| සෞඛ්‍ය සේවා සඳහා අයිතිය | 6 |
| කාර්ය මණ්ඩලයට දැනුම් දෙන්න | 7 |
| හොඳම අවශ්‍යතා තක්සේරුවක් යනු කුමක්ද? | 8 |
| අධ්‍යාපනයට ඇති අයිතිය | 8 |
| රැකියාවක නිරත වීමට ඇති අයිතිය | 9 |
| ඔබේ රැකවරණය සොයන්නාගේ ලේඛනය | 9 |
| ඔබ සහ ඔබේ පවුලේ අය නැවතී සිටින්නේ කොහේද? | 10 |
| කෙනෙක් ඔබට නරක ලෙස සැලකුවහොත් ඔබට කළ හැක්කේ කුමක්ද? | 11 |
| ඔබට සහ ඔබේ පවුලේ අයට පිළිගැනීම තුළ ඇති වගකීම් මොනවාද? | 12 |
| ඔබ හෙෝ ඔබේ පවුලේ අය ඔබේ වගකීම්වලට අනුකූල නොවන්නේ නම් කුමක් සිදුවේද? | 13 |
| ජාත්‍යන්තර ආරක්ෂාව සඳහා අයදුම් කිරීම සහ EU+ රටවලට ගමන් කිරීම සඳහා වන නීති | 14 |
| ඔබ සහ ඔබේ පවුලේ අය වෙනත් රටවලට පලා ගියහොත් කුමක් සිදුවේද? | 15 |
| බලධාරීන් විසින් ගනු ලබන තීරණයකට ඔබ එකඟ නොවන්නේ නම්,<br>ඔබට සහ ඔබේ පවුලේ අයට උපකාර කළ හැක්කේ කාටද? | 16 |
| යම් සහායක් වෙනස් වුවහොත් කුමක් සිදුවේද? | 16 |
| සම්බන්ධතා තොරතුරු | 17 |

## ඔබ සහ ඔබේ පවුල මෙම රට තුළ ආරක්ෂිතයි

ඔබ සහ ඔබේ පවුලේ අය අනතුරක සිටින නිසා ඔබේ රටට ආපසු යා නොහැකි බව ඔබ බලධාරීන්ට පැවසූ අතර ඔබ රැකවරණය සඳහා ඉල්ලුම් කර ඇත. ඔබ සහ ඔබේ පවුලේ අය ඉතාලිය හි රැකවරණය සොයන්නන් වේ.

## ඔබට උපකාර කළ හැක්කේ කාටද?



යුරෝපයේ, වයස අවුරුදු 18 ට අඩු සෑම කෙනෙකු ම දරුවෙකු ලෙස සැලකෙන අතර **විශේෂ සහාය** ලබා ගැනීමේ අයිතිය ඇත.

ඔබ රට තුළ රැඳී සිටින කාලය තුළ, පහත සඳහන් වෘත්තිකයන්ට ඔබට උපකාර කළ හැකිය, උදාහරණයක් ලෙස:

- **සමාජ සේවකයෙකු** ඔබේ එදිනෙදා අවශ්‍යතා සඳහා ඔබට සහ ඔබේ පවුලේ අයට උපකාර කරනු ඇත නැතහොත් නිශ්චිත ගැටලුවකට උපකාර කළ හැකි වෙනත් වෘත්තිකයන් සම්බන්ධ කර ගනු ඇත.
- ඔබට අසනීප ගතියක් දැනේ නම්, තුවාල වී ඇත්නම් හෝ ඔබට ඕනෑම ආකාරයක වෛද්‍ය ආධාර අවශ්‍ය නම් **වෛද්‍යවරයෙකු** හෝ **හෙදියක** ඔබට උපකාර කරනු ඇත.
- ඔබට දුකක්, කෝපයක්, බියක්, කනස්සල්ලක් දැනේ නම් හෝ නිදා ගැනීමට අපහසු බවක් දැනේ නම් **මනෝ විද්‍යාඥයෙකු** ඔබට උපකාර කරනු ඇත.
- රැකවරණ ක්‍රියාපටිපාටිය අතරතුර කුමක් සිදුවේද යන්න සහ ඔබේ අයිතීන්ට ගරු නොකරන බව ඔබ විශ්වාස කරන්නේ නම්, **නීති උපදේශකයෙකු** ඔබට සහ ඔබේ පවුලේ අයට වටහා ගැනීමට උපකාර කරනු ඇත.
- ඔබට වැටහෙන භාෂාවකින් සන්නිවේදනය කිරීමට **පරිවර්තකයෙකුට** උපකාර කළ හැකිය. ඔවුන්ගේ කාර්යභාරය වන්නේ ඔබ සහ අනෙක් අය පවසන දේ ඒ ආකාරයෙන්ම පරිවර්තනය කිරීමයි.
- ගුරුවරුන් ඔබට එම භාෂාව ඉගෙන ගැනීමටත්, පාසල් වැඩ කටයුතු සඳහාත් උපකාර කරනු ඇත.


ඔබට කිසියම් ගැටළුවක් තිබේද? ඔබට සැමවිටම කාර්ය මණ්ඩලයෙන් උපකාර සහ සහාය ඉල්ලා සිටිය හැකිය. බිය නොවන්න, ගැටළු එකට එක්ව විසඳා ගත හැකිය.

## ඔබට සහ ඔබේ පවුලේ අයට ලැබෙන්නේ මොනවාද?

බලධාරීන් ඔබේ රැකවරණ අයදුම්පත පරීක්ෂා කරන තෙක් ඔබ රැඳී සිටින අතරතුර ඔබට විවිධ ආකාරයේ සහාය සහ සේවාවන් ලැබෙනු ඇත. මෙය **පිළිගැනීම** ලෙස හැඳින්වේ.

දරුවෙකු ලෙස සහ රැකවරණය සොයන්නෙකු ලෙස ඔබට අයිතීන් ඇති අතර, ඔබ ගරු කළ යුතු වගකීම්ද ඇත. මේවා මෙම විස්තර පත්‍රිකාවේ පැහැදිළි කර ඇත.

මෙම විස්තර පත්‍රිකාවේ කොටස් ඔබට වැටහෙන්නේ නැත්නම් හෙෝ ඔබට කිසියම් ප්‍රශ්නයක් ඇත්නම්, කාර්ය මණ්ඩලයෙන් සහ ඔබේ දෙමාපියන්ගෙන් අසා දැනගන්න.



ඔබ මෙම රට තුළ රැඳී සිටින කාලය තුළ, ඔබේ තත්ත්වය අනුව කාර්ය මණ්ඩලය ඔබට අමතර තොරතුරු ලබා දෙනු ඇත. ඔබට ඕනෑම වේලාවක ප්‍රශ්න ඇසිය හැකිය.

**ඔබේ තත්ත්වය අනුව, ඔබට සහ ඔබේ පවුලේ අයට මේවා ලැබෙනු ඇත :**



- නිදා ගැනීමට ස්ථානයක්



- ආහාර



- ඇඳුම් පැළඳුම්



- පුද්ගලික සනීපාරක්ෂක නිෂ්පාදන




- ඔබේ පවුලට දෛනික වියදම් සඳහා මුදල් ද ලැබිය හැකිය.

## සෞඛ්‍ය සේවා සඳහා අයිතිය

**ඔබට අවශ්‍ය සෞඛ්‍ය සේවාව ඔබට ලැබෙන බවට බලධාරීන් සහතික වනු ඇත.**

**ඔබට ඇති ඕනෑම වෛද්‍ය ගැටලුවක් පිළිබඳව කාර්ය මණ්ඩලයට සහ ඔබේ පවුලේ අයට ඔබට දැනුම් දිය හැකිය.** ඔබට අවශ්‍ය නම් හෙදියක හෙෝ වෛද්‍යවරයෙකු හමුවීමට ඔවුන් ඔබට උපකාර කරනු ඇත.



වෛද්‍යවරයා එය අවශ්‍ය යැයි සලකන්නේ නම්, ඔවුන් ඖෂධ සහ විශේෂඥයින් හමුවීමට පැමිණීම් ද නියම කරනු ඇත.

ඔබට හෙදියක හෙෝ වෛද්‍යවරයෙකු සමඟ වෛද්‍ය පරීක්ෂණයකට සහභාගී විය හැකිද යන්න කාර්ය මණ්ඩලය ඔබට දන්වනු ඇත.

ඔවුන් ඔබේ සෞඛ්‍යය පිළිබඳව පරීක්ෂා කරනු ඇති අතර  ඔබට අවශ්‍ය සහාය ලබා දෙනු ඇත.


ඔබට හදිසි වෛද්‍ය ආධාර හෙෝ හදිසි ප්‍රතිකාර අවශ්‍ය තුවාලයක් ඇත්නම්, දෙමාපියන්ට හෙෝ කාර්ය මණ්ඩලයට දන්වන්නඔබ නැවතී සිටින ස්ථානයෙන් පිටත සිටී නම්, ඔබට හදිසි අවස්ථා අංකය වන 112 ට නොමිලේ ඇමතිය හැකිය.

## කාර්ය මණ්ඩලයට දැනුම් දෙන්න:





- ඔබට අසනීප වී, තුවාල ලබා හෝ හදිසි වෛද්‍ය ආධාර හෝ ප්‍රතිකාර අවශ්‍ය නම්
- ඔබ මත්ද්‍රව්‍ය භාවිත කරන්නේ නම් හෝ මත්පැන් පානය කරන්නේ නම්
- ඔබ අතීතයේ දී ප්‍රචණ්ඩත්වය හෝ අපයෝජනය අත්විඳ ඇති හෝ දැන් එය අත්විඳිමින් සිටී නම්
- ඔබ ගැබිගෙන සිටී නම් හෝ ගැබිගෙන සිටිය හැකි නම්
- ඔබට තනිවම ඇවිදීමට නොහැකි හෝ ඔබට ඇසීමේ සහ දැකීමේ අපහසුතා තිබේ නම්
- ඔබට කනස්සල්ලක්, දුකක් දැනෙනවා නම්, ඔබට නිදාගත නොහැකි නම් හෝ ඔබට සෘණාත්මක සිතුවිලි තිබේ නම්
- ඔබට අනාරක්ෂිත බවක් දැනෙනවා නම් හෝ යමෙකුට, ආගන්තුකයෙකුට හෝ ඔබ දන්නා පුද්ගලයෙකුට පවා බිය නම්
- ඔබට කිරීමට අවශ්‍ය නැති දේවල් කිරීමට ඔබට බල කර තිබේ නම් හෝ බල කරන්නේ නම්
- ඔබේ ඇදහිල්ල, ඔබ ආදරය කරන අය, ඔබ අඳින පළඳින ආකාරය හෝ හැසිරෙන ආකාරය නිසා ඔබට අනාරක්ෂිත බවක් දැනේ නම්
- ඔබේ පවුලේ සාමාජිකයින්ට සහාය අවශ්‍ය නම්.



## හොඳම අවශ්‍යතා තක්සේරුවක් යනු කුමක්ද?



- ඔබේ අවශ්‍යතා වටහා ගැනීමට
- ඔබට අවශ්‍ය කුමන සහාය ද තීරණය කිරීමට

ඔබෙන් ප්‍රශ්න අසන අනෙකුත් කාර්ය මණ්ඩලය වෛද්‍යවරයෙකු, සමාජ සේවකයෙකු හෙෝ මනෙෝවිද්‍යාඥයෙකු ඔබට දැකගත හැක..

මෙය බලධාරීන්ට වැදගත් තීරණ ගැනීමට උපකාරී වනු ඇත, උදාහරණයක් ලෙස ඔබ සහ ඔබේ පවුලේ අය නැවතී සිටින ස්ථානය.

ඔබට හෙදිය, වෛද්‍යවරයා සහ කාර්ය මණ්ඩලය විශ්වාස කළ හැකිය. ඔබ පවසන කිසිවක් ඔබේ අවසරයකින් තොරව ඔබේ දෙමාපියන්ට හැර වෙනත් කිසිවෙකු සමඟ බෙදා නොගනු ඇත. එසේ නොවන්නේ නම් ඒ ඔබේ හෙෝ වෙනත් අයෙකුගේ ජීවිතය අවදානමට ලක්ව ඇත්නම් පමණි.

ඔබේ දෙමාපියන් දැනුවත් කිරීමට හෙෝ සම්බන්ධ කර ගැනීමට ඔබට අවශ්‍ය නැතිනම්, කාර්ය මණ්ඩලයට දන්වන්න. ඔවුන් ඔබේ ඉල්ලීම පරීක්ෂා කර ඔබට වඩාත් සුදුසු දේ මත පදනම්ව තීරණය කරනු ඇත.

## අධ්‍යාපනයට ඇති අයිතිය



දරුවෙකු ලෙස, ඔබට අධ්‍යාපනය ලැබීමට සහ ඉගෙනීමට අයිතිය තිබේ. ඔබ පාසල් ගොස් මෙම කාලය තුළ ඔබට වයස අවුරුදු 18 ක් සපිරෙන්නේ නම්, පාසල් අධ්‍යාපනය අවසන් වන තුරු ඔබට ඔබේ පැමිණීම දිගටම කරගෙන යා හැකිය.

කාර්ය මණ්ඩලය ඔබට සහ ඔබේ පවුලේ අයට මෙරට පාසලේ ලියාපදිංචි වීමට සහාය වනු ඇත. මූලික භාෂා පන්ති සහ අනෙකුත් පාඨමාලා පිළිබඳව ඔවුන් ඔබට දැනුම් දෙනු ඇත. ඔබට මෙම පාඨමාලා කිහිපයකට සහභාගී වීමට සිදු විය හැකිය.

ඔබට ඉගෙනීමට, සංවර්ධනය වීමට සහ නව මිතුරන් ඇති කර ගැනීමට උපකාර කිරීම සඳහා අධ්‍යාපනික සහ විනෝදාත්මක ක්‍රියාකාරකම් පිළිබඳව කාර්ය මණ්ඩලය ඔබට පවසනු ඇත.

## රැකියාවක නිරත වීමට ඇති අයිතිය





ඔබේ වයස සහ ඔබේ තත්ත්වය අනුව, ඔබට අවශ්‍ය නම්, ඉතාලියෙහි රැකියාවක නිරත වීමට ඔබට අවසර ලැබිය හැකිය. කාර්ය මණ්ඩලය ඔබට වැඩිදුර තොරතුරු ලබා දෙනු ඇත.

ඔබේ අයදුම්පත පැහැදිලිවම පදනම් විරහිත එකක් නොවන තාක් කල්, එය නිල වශයෙන් ඉදිරිපත් කිරීමෙන් දින 90කට පසු ඔබට රැකියාවේ නිරත විය හැකිය.



වයස අවුරුදු 16ට අඩු දරුවන්ට වැඩ කළ නොහැක.

## ඔබේ රැකවරණය සොයන්නාගේ ලේඛනය



ඔබේ නම සහ ඡායාරූපය සහිත පුද්ගලික ලේඛනයක් ඔබට ලැබෙනු ඇත.

මෙයින් පෙන්නුම් කරන්නේ ඔබ මෙම රටෙහි රැකවරණය සොයන්නෙකු බවයි.

ඔබ එය සැමවිටම ඔබ සමඟ රැගෙන යා යුතුය.

මෙම ලේඛනය වැදගත් එකකි. එය නැති කර නොගැනීමට සහ වෙනත් අයෙකුට ලබා නොදීමට වගබලා ගන්න.

## ඔබ සහ ඔබේ පවුලේ අය නැවතී සිටින්නේ කොහේද?

බලධාරීන් ඔබේ රැකවරණ අයදුම්පත පරීක්ෂා කරන අතරතුර ඔබ නැවතී සිටින ස්ථානය රඳා පවතින්නේ ඔබේ තත්ත්වය මතයි.



කාර්ය මණ්ඩලය **ඔබ නැවතී සිටිය යුතු ස්ථානය** ඔබට දන්වනු ඇත, උදාහරණයක් ලෙස යම් නවාතැනක, නගරයක හෙෝ කලාපයක.

මෙය ලබා ගත හැකි ස්ථාන හෙෝ ඔබේ පවුලේ අවශ්‍යතා මත රඳා පැවතිය හැකිය.

ඔබේ පවුලට නැවතී සිටින ස්ථානයෙන් පිටත නැවතී සිටීමට හෙෝ නගරයෙන් හෙෝ කලාපයෙන් කෙටි කාලයක් පිටව යාමට අවශ්‍ය නම්, ඔවුන් අධිකාරියෙන් අවසර ඉල්ලා සිටිය යුතුය.

**බලධාරීන් විසින් තීරණය කරන ලද ස්ථානයේ දී පමණක් ඔබට සහාය සහ සේවාවන් ලැබෙනු ඇත..**

ඉතාමත් කලාතුරකින්, තමන්ට අවශ්‍ය පරිදි යාමට සහ ඒමට නොහැකි මධ්‍යස්ථානයක පවුල් තැබිය හැකිය. ඔබ සිටින්නේ මේ තත්වයේ නීති උපදේශකයෙකු සහ කාර්ය මණ්ඩලය ඔබට සහාය වනු ඇත.

**ඔබ කොතැනක නැවතී සිටියත්, ඔබට පහත අයිතීන් ඇත:**



- **ඔබේ පවුලේ අය සමඟ නැවතී සිටීමට**





- **ඔබේ පවුලේ සාමාජිකයන් සිටින ස්ථානය ඔබ නොදන්නේ නම්, ඔවුන්ව සොයා ගැනීමට උපකාර ලබා ගන්න.**

**ඔබට සුරක්ෂිතව සිටීමට අයිතිය ඇත. කිසිවෙකුට පහත දේ සඳහා ඉඩ නැත:**





ඔබට තර්ජනය කිරීමට

ඔබට අපහාස කිරීමට

ඔබට හානි සිදු කිරීමට

ඔවුන් කවුරුන් වුවත්, ආගන්තුකයෙකු හෙෝ ඔබ දන්නා කෙනෙකු වුවත්.

ඔබේ දෙමාපියන් හෙෝ කාර්ය මණ්ඩලය සමඟ ඔබට කිසියම් ගැටළුවක් ඇත්නම්, ඔබට ඒ පිළිබඳව කතා කළ හැකිය.

## කෙනෙක් ඔබට නරක ලෙස සැලකුවහොත් ඔබට කළ හැක්කේ කුමක්ද?



ඔබ විශ්වාස කරන පුද්ගලයෙකු, පවුලේ සාමාජිකයෙකු හෙෝ කාර්ය මණ්ඩල සාමාජිකයෙකු සමඟ කතා කළ හැකිය කෙසේ වෙතත්, ඔබේ අයිතිවාසිකම් ආරක්ෂා කරන 'ළමුන් සහ යොවුන් වියේ පසුවන්නන් සඳහා වන අධිකාරිය' ඉතාලිය සතුව පවතී.

යමෙකු ඔබට නරක ලෙස සලකන්නේ නම්, එය නැවත සිදුවීම වළක්වා ගැනීම සඳහා ඔබට බලධාරීන් වෙත වාර්තා කළ හැකිය. මෙය 'පැමිණිල්ලක් කිරීම' ලෙස හැඳින්වේ.



**අවධානය පිණිසයි!**

ඔබ නැවතී සිටින ස්ථානයෙන් පිටත සිටී නම් සහ ඔබ අනතුරේ නම්, ඔබට ඕනෑම දුරකථනයකින් ජාතික හදිසි අංකය වන 112 ට නොමිලේ ඇමතිය හැකිය.

## ඔබට සහ ඔබේ පවුලේ අයට පිළිගැනීම තුළ ඇති වගකීම් මොනවාද?

ඔබේ කතාව පැවසීමට ඇතැම් විට බියක් හා දුෂ්කර බවක් දැනුණ ද, ඔබ සත්‍යය පැවසීම සහ බලධාරීන් සමඟ සහයෝගයෙන් කටයුතු කිරීම වැදගත් වේ.

කාර්ය මණ්ඩලය ඔබේ තත්ත්වය පිළිබඳව දන්නේ නම් ඔවුන්ට ඔබට උපකාර කළ හැකිය.



ඔබ සහ ඔබේ පවුලේ අය කොතැනක නැවතී සිටියත්, අනුගමනය කිරීමට නීති තිබේ. උදාහරණයක් ලෙස, ඔබ අනෙකුත් පදිංචිකරුවන්ට සහ කාර්ය මණ්ඩලයට ගරු කළ යුතු අතර, නිහඬ වේලාවන් තුළ ඔබ ඝෝෂාකාරී නොවිය යුතුය

නීති සහ නීති අනුගමනය නොකරන විට ඇතිවන ප්‍රතිවිපාක කාර්ය මණ්ඩලය විසින් පැහැදිලි කරනු ඇත.

ඔබ සහ ඔබේ පවුලේ අය පහත දේ සිදු කිරීම ඉතා වැදගත් වේ :

- ✓ ඔබ නැවතී සිටින ස්ථානයේ නීති අනුගමනය කරන්න.
- ✗ බලධාරීන් ඔබට නැවතී සිටීමට පැවසූ ස්ථානයෙන් පලා නොයන්න.
- ✓ කාර්ය මණ්ඩලය ඔබට පැහැදිලි කරන මේ රටේ නීති අනුගමනය කරන්න.

## ඔබ හෙෝ ඔබේ පවුලේ අය ඔබේ වගකීම්වලට අනුකූල නොවන්නේ නම් කුමක් සිදුවේද?



මෙය සිදුවුවහොත්, ඔබට කාර්ය මණ්ඩලය සමඟ විවෘතව කතා කළ හැකි අතර ඔබේ තත්ත්වය සහ ඔබේ හේතු පැහැදිළි කළ හැකිය

බලධාරීන් ඔබේ තත්ත්වය ඇගයීමට ලක් කර යම් ක්‍රියාමාර්ග ගැනීමට තීරණය කළහොත් ඔබේ දෙමාපියන්ට දැනුම් දෙනු ඇත.



උදාහරණයක් ලෙස, බලධාරීන් පවුලේ අයට නැවතී සිටීමට පැවසූ ස්ථානයෙන්, නගරයෙන් හෙෝ කලාපයෙන් ඔබේ පවුලේ සාමාජිකයෙකු පලා ගියහොත්, **එම පවුලේ සාමාජිකයාට අඩු සහයෙෝගයක් ලැබිය හැකිය.**



ඔබේ පවුලේ සාමාජිකයෙකු ප්‍රචණ්ඩකාරී ලෙස හැසිරෙන්නේ නම්, **එම පවුලේ සාමාජිකයාට ලැබෙන සහයෙෝගය අහිමි විය හැකිය.** පොලිසිය ද කැඳවිය හැකිය.

**ඔබ සහ ඔබේ පවුලේ අය දැන් ඉතාලිය හි සිටින අතර, එය EU රටකි.**
**EU+ රටවල් වන්නේ:**

යුරෝෝපීය සංගමයේ (EU) සාමාජික රටවල් 27: ඔස්ට්‍රියාව, බෙල්ජියම, බල්ගේරියාව, ක්‍රොඒෂියාව, සයිප්‍රසය, චෙකියාව, ඩෙන්මාර්කය, එස්තෙෝනියාව, ෆින්ලන්තය, ප්‍රංශය, ජර්මනිය, ග්‍රීසිය, හංගේරියාව, ඉතාලිය, ලැට්වියාව, ලිතුවේනියාව, ලක්සම්බර්ග්, මෙෝල්ටාව, නෙදර්ලන්තය, පෙෝලන්තය, පෘතුගාලය, අයර්ලන්ත ජනරජය, රුමේනියාව, ස්ලෙෝවැකියාව, ස්ලෙෝවේනියාව, ස්පාඤ්ඤය, ස්වීඩනය සහ

අනෙකුත් රටවල් 4: අයිස්ලන්තය, ලීච්ටන්ස්ටයින්, නෙෝර්වේ සහ ස්විට්සර්ලන්තය.

## රැකවරණය සඳහා අයදුම් කිරීම සහ EU+ රටවලට ගමන් කිරීම සඳහා වන නීති

**කාර්ය මණ්ඩලය [*සාමාජික රටට අවශ්‍ය පරිදි වෙනස් කිරීමට*] මෙම වැදගත් නීති ඔබට සහ ඔබේ පවුලේ අයට පැහැදිළි කර දෙනු ඇත. ඔබට ඕනෑම වේලාවක ඔවුන්ගෙන් ප්‍රශ්න ඇසිය හැකිය.**



- ✔ ඔබ සහ ඔබේ පවුලේ අය ඉතාලිය තුළ නැවතී සිටිය යුතු අතර අනෙකුත් එක් EU+ රටකට හෙෝ පලා නොයා යුතුය.
- ✔ මෙම රටවලින් එකක ඔබේ පවුලේ සාමාජිකයන් සිටී නම්, පවුල් නැවත එක්වීම සඳහා වන ඔබේ අයිතීන් පිළිබඳව බලධාරීන් ඔබට දැනුම් දෙනු ඇත. හේතුවක් නොමැතිව පලා නොයන්න.

ඔබට මේ රට හැර යාමට සිතෙන්නට පුළුවන, නැතහොත් ඇතැම් අය ඔබට පලා යාමට ඒත්තු ගැන්වීමට උත්සාහ කරනු ඇත. එය ඔබට භයානක විය හැකිය. ඔබට සහ ඔබේ පවුලේ අයට කාර්ය මණ්ඩලය සමඟ කතා කර තත්වය පැහැදිළි කළ හැකිය. කාර්ය මණ්ඩලයට ඔබට උපදෙස් ලබා දිය හැකිය.


- ✖ ඔබ පලා ගියහොත්, ඍණාත්මක ප්‍රතිවිපාක ඇති වේ, ඒ පිළිබඳ විස්තර පත්‍රිකාවේ පැහැදිළි කර ඇත. උදාහරණයක් ලෙස, ඔබට අනෙක් රට තුළ දී අඩු සහායක් පිළිගැනීමේ දී ලැබෙනු ඇත.

- ✔ බලධාරීන් ඔබට වෙනත් ආකාරයකින් දැනුම් දුන්නේ නම් මිස, ඔබ මුලින් ම පැමිණි EU+ රටෙහි ඔබේ රැකවරණ අයදුම්පත ලියාපදිංචි කළ යුතු බව මතක තබා ගන්න.

- ✔ ඔබේ රැකවරණ අයදුම්පත පරීක්ෂා කිරීම සඳහා වගකිව යුත්තේ මෙම රටවලින් එකක් පමණි. ඉතාලිය හි බලධාරීන් මේ සඳහා වගකිව යුතු රට කුමක්ද යන්න ඔබට පවසනු ඇත.

මෙම ක්‍රියාපටිපාටි පිළිබඳව ඔබ වෙනම විස්තර පත්‍රිකාවලින් වැඩිදුර දැනගනු ඇත.

## ඔබ සහ ඔබේ පවුලේ අය EU+ රටවලට පලා ගියහොත් කුමක් සිදුවේද?




**ඉතාලියෙහි :**

- ඔබේ රැකවරණ ක්‍රියාපටිපාටිය නතර විය හැකිය.

**අනෙක් EU+ රටෙහි :**

- ඔබ හැර ගිය EU+ රටට ඔබව ආපසු යැවීමට බලධාරීන් තීරණය කළ හැකිය.

බලධාරීන් ඔබව ආපසු යැවීමේ තීරණය පිළිබඳ ව ඔබට දැනුම් දුන් මොහොතේ සිට, ඔබට ඇතැම් අයිතීන් සඳහා ප්‍රවේශය නොලැබෙනු ඇත, උදාහරණයක් ලෙස:

- ඔබට ඇතැම් ආකාරයේ සහායන් නොලැබෙනු ඇති අතර
- ඔබට රැකියාවක නිරත වීමට අවසර නොලැබෙනු ඇත.

## බලධාරීන් විසින් ගනු ලබන තීරණයකට ඔබ එකඟ නොවන්නේ නම්, ඔබට සහ ඔබේ පවුලේ අයට උපකාර කළ හැක්කේ කාටද?



ඔබට නීති උපදේශකයෙකුගෙන් උපකාර ඉල්ලා සිටිය හැකිය. නීති උපදේශකයෙකු යනු මේ රටේ නීති දන්නා සහ ඔබේ තත්ත්වය අධ්‍යයනය කර ඔබට සහාය විය හැකි පුද්ගලයෙකි.

ඔබට තොරතුරු සහ සහාය ලබා දිය හැකි රාජ්‍ය නොවන සංවිධාන පිළිබඳව ද කාර්ය මණ්ඩලය ඔබට දැනුම් දෙනු ඇත.




ඔබට ඕනෑම වේලාවක එක්සත් ජාතීන්ගේ සරණාගතයින් පිළිබඳ මහ කොමසාරිස් කාර්යාලය (UNHCR) සම්බන්ධ කරගත හැකිය. තම රට හැර යාමට සිදු වන පුද්ගලයින් UNHCR විසින් ආරක්ෂා කෙරේ.

## යම් සහායක් වෙනස් වුවහොත් කුමක් සිදුවේද?

13 වන පිටුවේ විස්තර කර ඇති ආකාරයේ තත්වයක් හේතුවෙන් පවුලේ සාමාජිකයෙකුට ලැබෙන යම් යම් ආකාරයේ ආධාර සීමා කිරීමට හෙෝ අවලංගු කිරීමට ජතීරණය කළහොත්, එම සාමාජිකයාට ඔවුන්ගේ පෞද්ගලික තත්ත්වය මත පදනම්ව තවදුරටත් ආධාර ලැබෙනු ඇත.ඔවුන්ට තවමත් වෛද්‍යවරයෙකු හෙෝ හෙදියක හමුවීමට, වෛද්‍ය ආධාර ලබා ගැනීමට, යම් සහායක් ලබා ගැනීමට  සහ බලධාරීන් විසින් තීරණය කරන ලද ස්ථානයක නිදා ගැනීමට ස්ථානයක් ලබා ගැනීමට හැකි වනු ඇත.



ඔබ වෙනත් EU+ රටකට පලා යාම නිසා ඔබට සහ ඔබේ පවුලේ අයට ලබා දෙන පිළිගැනීමේ සහාය අවලංගු කිරීමට බලධාරීන් තීරණය කළ විට, ඔබට තවමත් ලැබෙන සහායේ ආකාරය ඔබේ තත්ත්වය සහ අවශ්‍යතා මත රඳා පවතිනු ඇත.

ඔබට තවමත් පාසල් යාමට හැකි වනු ඇත.

## මනෙෝ සමාජීය සහාය



## ළමා ආරක්ෂණය



## අනතුරේ සිටින දරුවන් සඳහා උපකාරක සේවය



ඔබ නොසලකා හැර ඇති බව හෙෝ අනතුරක සිටින බව ඔබට හැඟේ නම්, ඔබට නොමිලේ 119 ඇමතිය හැකිය සාමාජික රටට

ඔබේ සහෙෝදරයා, සහෙෝදරිය හෙෝ මිතුරෙකු අතුරුදහන් වී ඇත්නම්, ඔබට 116 000 ක්ෂණික ඇමතුම් අංකය ඇමතිය හැකිය - Missing Children Europe

## නීති උපදේශනය, සහාය සහ නියෙෝජනය



EUROPEAN UNION AGENCY FOR ASYLUM

MINISTERO DELL'INTERNO

මෙම විස්තර පත්‍රිකාව තොරතුරු දැනගැනීමේ අරමුණු සඳහා පමණි. එමඟින් අයිතීන් හෝ වගකීම් නිර්මාණය නොකරයි. මෙම ලේඛනයේ ප්‍රධාන කොටස සපයා ඇත්තේ යුරෝපීය සංගමයේ රැකවරණය සඳහා වූ ආයතනය (EUAA) විසින් වන අතර, මෙම විස්තර පත්‍රිකාව පිටපත් කිරීම සහ වෙනස් කිරීම සඳහා EUAA විසින් අවසර දී ඇත්තේ EU සාමාජික රටවල් සඳහා පමණි. මෙම විස්තර පත්‍රිකාවේ ඇතුළත් තොරතුරුවල නිරවද්‍යතාවය, අන්තර්ගතය, පරිපූර්ණත්වය, නීත්‍යානුකූලභාවය හෝ විශ්වසනීයත්වය සඳහා EU සාමාජික රටවල හෝ වෙනත් වගකිවයුතු තෙවන පාර්ශවයක කිසිදු වගකීමක් හෝ වගවීමක් EUAA විසින් පිළි නොගැනේ. මෙම විස්තර පත්‍රිකාවේ අන්තර්ගත තොරතුරු මඟින් නිර්මාණය කළ හැකි යම් භාවිතයක් සඳහා EUAA හෝ EUAA වෙනුවෙන් ක්‍රියා කරන කිසිදු පුද්ගලයෙකු වගකිව යුතු නොවේ.

© European Union Agency for Asylum, 2025